3 වන පිටෙන්

ජනතාවගෙන් සීයෙන් පංගුවකටවත් ගුවන් සේවා වැදගත් නැහැ. මේ තේරුමක් නැතිකම දුටු රජය ජාතික ගුවන් සේවය පෞද්ගලීකරණය කළත්, මහින්ද රාජපක්ෂ රජය තනිකර ම පටු අරමුණු මත එය නැවතත් රජයට පවරා ගත්තා. දැන් එය මහජන මුදල් ගිලින යකෙකු බවට පත් වෙලා. විකුණාගන්නට හෝ බැරි වී තිබෙනවා.

රජයේ මූලික ගැටලුව මෙතනින් තේරුම් ගන්නට පුළුවන්. රජය කියන්නේ මොකක් ද? රජය පවතින්නේ කා වෙනුවෙන් ද? රජය පවතින්නේ මහජනතාව වෙනුවෙන් ද? එය පවත්වාගෙන යන්නේ ඇත්තට ම මහජනතාව ද?

**රජයේ සේවකයන් ලක්ෂ 15ක් ඉන්නවා. විශ්‍රාමිකයන් ලක්ෂ පහකුත් ඉන්නවා. මේ රජය පවත්වාගෙන යාම වෙනුවෙන් මේ රටේ මහජනතාව අති විශාල බදු බරකට කර ගහනවා. ඒ බදු මුදල්වලින් වැඩි කොටසක් වැය වන්නේ දේශපාලකයන්ට, රජයේ නිලධාරීන්ට හා රජයේ සේවකයන්ට පඩි ගෙවන්න. ඒ වුණාට ඒ රජයේ සේවකයන් මහජනතාවට ලබා දෙන සේවා සම්පාදනයේ තත්වය පිළිබඳ මේ රටේ ඕනෑම කෙනෙකු දන්නවා.**




රජය මේ වන විට තවදුරටත් මහජනතාව විසින් මහජනතාව වෙනුවෙන් පවත්වාගෙන යන එකක් නොවෙයි. රජය පවතින්නේ රජය වෙනුවෙන්මයි. ඒක තේරුම් ගන්න එක එච්චර අමාරු නැහැ.

දැන් ලංකාවෙ පවත්නා රජය ගන්න. මෙහි රජයේ සේවකයන් ලක්ෂ 15ක් ඉන්නවා. විශ්‍රාමිකයන් ලක්ෂ පහකුත් ඉන්නවා. මේ රජය පවත්වාගෙන යාම වෙනුවෙන් මේ රටේ මහජනතාව අති විශාල බදු බරකට කර ගහනවා. ඒ බදු මුදල්වලින් වැඩි කොටසක් වැය වන්නේ දේශපාලකයන්ට, රජයේ නිලධාරීන්ට හා රජයේ සේවකයන්ට පඩි ගෙවන්න. ඒ වුණාට ඒ රජයේ සේවකයන් මහජනතාවට ලබා දෙන සේවා සම්පාදනයේ තත්වය පිළිබඳ මේ රටේ ඕනෑම කෙනෙකු දන්නවා.










**TO LET**

**MOUNT WAVERLEY**
GRANNY FLAT,

Standalone one BR unit with amenities and parking. Separate entrance and service connections. Suits a couple. $230 p/w,

**Text: 0423304673**